# නීති ප්‍රතිසංස්කරණය සඳහා වන ජාතික ව්‍යාපාරය

නීතිය, නිතියේ ආධිපත්‍ය, අපරාධ පිලිබඳ විමර්ශනය, ස්වාධීන අධිකරණ පද්දතියක පැවැත්ම, යුක්තිය පසඳලීම, අපරාධ යුක්තිය, රටේ මූලික නීතිය තුල පුරවැසියාගේ නිදහස හා ජීවිතයට ඇති අයිතිය සුරැකීම මෙන්ම තීන්දු තීරන ගැනීමේ දී ස්වභාවික යුක්තියට අනුවක්‍රියාකිරීම නූතන ජාතික රාජ්‍යයක පැවැත්ම හා ස්තාවරත්වයට අත්‍යවශ්‍ය වන්නාවූ පූර්ව කොන්දේසි වන්නේය. මේ සියලු සංකල්ප එක්තැන් වූ කල පුරවැසියන් වන අප ජාතික රාජ්‍ය තුලින් අපේක්ෂා කරන්නේ යුක්තිය හා සාධාරණයයි.

දශක 7 කට ආසන්නවූ අපගේ ජාතික රාජ්‍යයේ පැවැත්ම මෙන්ම ඒ තුලින් රට වැසියා අපේක්ෂා කරන ලද යුක්තිය හා සාධාරණය දෙස බලන කල මෙරට රට වැසියන්ට එකී යුක්තිය හා සාධාරණය පූර්ණ ලෙස භුක්ති විඳින්නට ඉඩ ලැබුනේද යන්න ප්‍රශ්න ගත වන්නේය. අප එලෙස පසු කල දශක 7 තුල මෙම විෂය කලමනාකරණය කරන්නට විෂයානුබද්ධ දැනුම සහිත අධිකරණ ඇමති වරුන් ද සිටියේය. අධිකරණ පද්ධතියක්ද පැවතුනේය. නීති හඳුන්වාදීමද මැනවින් ක්‍රියාත්මකවුයේය.
නමුත් අදටත් රට වැසියාගේ යුක්තිය හා සාධාරණය පිලිබඳ දුක්ගැනවිල්ල එලෙසටම නොවෙනස්ව පවතින්නේය යන්න අතිශෝක්තියක් නොවන්නේය.

එම නිසාම රටේ නීතිය, නිතියේ ආධිපත්‍ය, අපරාධ පිලිබඳ විමර්ශනය, ස්වාධීන අධිකරණ පද්දතියක පැවැත්ම, යුක්තිය පසඳලීම, අපරාධ යුක්තිය, රටේ මූලික නීතිය තුල පුරවැසියාගේ නිදහස හා ජීවිතයට ඇති අයිතිය සුරැකීම මෙන්ම තීන්දු තීරන ගැනීමේ දී ස්වභාවික යුක්තියට අනුව ක්‍රියාකිරීම සඳහා වන ගැඹුරු හා ප්‍රතිපලදායක මහජන සංවාදයක් ඇරඹීමේ දැවැන්ත අවශ්‍යතාවයක් සහ ඒසඳහාවන සමාජමය පෙලඹවීමක් මේ වන විට මතුව තිබේ. එවැනි සමාජ සංවාදයක් තුලින් තීන්දු තීරන ගන්නා රජයකට රටේ යුක්තිය ඉටු කිරීම සඳහා නීති, කාර්යපටිපාටීන් සහ නිසි ආකල්ප පාර්ලිමේන්තුවට මෙන්ම යුක්තිය පසඳලනු ලබන ආයතන සඳහා හඳුන්වා දෙන්නට හා එම සංකල්ප උපුටා ගන්නා ලෙස ඒත්තු ගැන්වීමට කාලය එලඹ තිබේ.

නීති ප්‍රතිසංස්කරණය සඳහා ජාතික ව්‍යාපාරය අරඹන්නේ ඉහතකී සද් අරමුන සිය මූඛ්‍ය පරමාර්ථය ලෙස පෙරදැරි කොටගෙනය. මෙම ව්‍යාපාරය සඳහා එක්වන්නට යයි අප රටේ සියලු පුරවැසියන්ටද, නීතිඥ ප්‍රජාවටද, වෘත්තිකයන් ඇතුලු රටේ දැන උගත් පරම්පරාවටද මෙනයින් ආරාධනය කොට සිටින්නෙමු.

මෙම ව්‍යාපාරයේ මූලික කර්තව්‍යන් ලෙස පහත සඳහන් පරිවර්තනයන් සිදු කරන ලෙසට වර්තමාන රජයට යෝජනා කරන්නෙමු.

1. රටේ මූලික නීතිය වන ආන්ඩු ක්‍රම ව්‍යවස්තාවට යුක්තිය ඉටුකිරීමට අදාල ප්‍රතිසංස්කරන හඳුන්වා දීම,
2. රටේ පවතින නීති පද්දතිය තුල ශ්‍රී ලංකාව නූතනත්වයට ගෙන ඒම සඳහා අවැසි ප්‍රතිසංස්කරන හඳුන්වාදීම,
3. නීතියේ ආධිපත්‍ය තහවුරු කිරීම සඳහා විධායකය හා අධිකරණය අතර පවත්වා ගත යුතු තුලන හා සංවරන ක්‍රමයන් හඳුන්වා දීම,

4. යුක්තිය පසඳලීමේ දී අත්‍යවශ්‍යවන අධිකරණමය ආකල්ප හා චර්යා පද්ධතියක් අධිකරණමය විනිශ්චයක ක්‍රමයට හඳුන්වාදීම
5. යුක්තිය අපේක්ෂාකරනු ලබන පුරවැසියන්ගේ අයිතිවාසිකම් හා අපේක්ෂා තෘප්ත කරනු ලබන යුක්තිය පසඳලීමේ ක්‍රියාදාමයන් හා එසඳහා සානුබල සපයන පරිසරයක් ඇති කිරීම සඳහා වන ක්‍රම පද්ධතියක් හඳුන්වාදීම
6. අපරාධ විමර්ෂනය සඳහා ස්වාධීන හා කාර්යක්ෂම පොලිසියක් ස්තාපිත කිරීම සඳහා වන ප්‍රතිසංස්කරන හඳුන්වාදීම
7. රජයේ විධායකක්‍රියාතුලින් ස්වභාවික යුක්තිය තහවුරු කිරීම සඳහා වන කාර්යපටිපාටික ප්‍රතිසංස්කරන හඳුන්වාදීම.

ඉහත කී අරමුන පෙරදැරි කොට ගෙන ක්‍රියාත්මක වන මෙම ජාතික ව්‍යාපාරය තම අභිනව ක්‍රියාමාර්ගය ලෙස සංවාදයට යොමු කරන්නේ අධිකරණයට අපහාස කිරීම අරබයා අප රට තුල බලපවත්වන නීති තත්වයයි.

මෙම නීතිය පිලිබඳව අප ව්‍යාපාරයේ අවධානය යොමු වන්නේ මෑතකදී පාර්ලිමේන්තු මන්ත්‍රීරන්ජන් රාමනායක මහතාට එරෙහිව ශේෂ්ඨාධිකරනය විසින් ලබා දුන් තීන්දුව පාදක කොට ගනිමිනි.
එනම් අධිකරණය එලෙස රාමනායක මන්ත්‍රී වරයාට දඬවම් ලබා දෙන්නේ ඒ පිලිබඳව නිශ්චිත නීතියක පහස නොවිඳිමිනි. නමුත් අද අප ඉදිරියේ පවතින අභියෝගය වන්නේ රාමනායක මන්ත්‍රිවරයා වෙනුවෙන් යුක්තිය ඉල්ලා සිටීමට පමනක් නොව අනාගතයේදී මෙවැනි යුක්තිය අපගමනයක් වීම වැලැක්වීම සඳහා වන නව නීතියක් අදාල ක්ෂේත්‍රයට හඳුන්වාදීමයි.
අප රටට පුලුල් ව්‍යුහයකින් සම්පාදනය වුන අධිකරණ අපහාස නීතියට හා විණිශ්චාභිමුක රීතියට අයත් පරාසය නියත වශයෙන්ම පැහැදිලි කරනු පිනිස ස්තාවර හා පටිපාටිගත අධිකරණ අපාහාස පනතක් තිබිය යුතු වන්නේය. එසේම අධිකරණයට අපහාසයක් සිදු වී ඇතැයි තහවුරුවූ විට පැවරිය යුතු උපරිම දඬුවම නීතිය මඟින්ම නියම කොට තිබිය යුතු වන්නේය.

මෙවැනි නීතියක අවශ්‍යතාවය මුලින්ම මතු කරන ලද්දේ මෙරට මාධ්‍යවේදීන් සමුහයක් විසින් වර්ෂ ... ප්‍රකාෂයට පත් කරන ලද කොළඹ ප්‍රකාෂණය මගිනි. එසේම 2001-2002 පාර්ලිමේන්තු තේරීම් කමිටුවක් මගින්ද අධිකරණ අපහාසයට අදාල වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබ තිබේ. වර්ශ 2008 දී නීති කොමිසම මගින් මෙම නීතිය කෙටුම්පතක් ලෙස හඳුන්වා දී තිබේ. නමුක් මෙම නීතිය පාර්ලිමේන්තවට ඉදිරිපත් කොට තවමත් නීතියක් බවට පත්වීම පුරා දශකයකට අධික කාලයක් අතපසු කොට තිබේ.

මෙවැනි නීතියක් ප්‍රජාතන්ත්‍රවාදී ලෝකයට අලුත් දෙයක් නොවන්නේය. 1971 දී ඉන්දියාව පනතක් ලෙස හඳුන්වා දී ඇති අතර 1981 දී බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවද මෙම නිතිය පනතක් ලෙස සම්මත කරගනු ලැබ තිබේ. එසේම International best practices and standards of constitutional democracy හි මෙම නීති සංකල්පය අත්‍යවශ්‍ය අංගයක් ලෙස හඳුන්වා දී තිබේ. එම නිසා නීති ප්‍රතිසංස්කරණය සඳහා ජාතික ව්‍යාපාරය අධිකරණයට අපහාස කිරීමට අදාල නීති කෙටුම්පතක් සමාජ සංවාදය සඳහා ඉදිරිපත් කර සිටින අතර එකී සංවාදය අවසානයේ දී එම කෙටුම්පත රජයේ අවධානය යොමු කිරීම උදෙසා පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ලෙස පාර්ලිමේන්තුවට යොමු කිරීමට අදහස් කොට සිටිමු.

මහජන මන්ත්‍රී රන්ජන් රාමනායක මහතාට යුක්තිය අපගමනයන් වී ඇතිදැයි සොයා බැලීමට ශ්‍රේෂ්ඨාධිකරණයේ පූර්ණ විනිශ්චය මන්ඩලයක් පත් කරන්න යයි අප ව්‍යාපාරය ගරු අගවිනිසුරු තුමන් ගෙන් ඉල්ලා සිටින අතර එසේ නොවන්නේ නම් අප ව්‍යාපාරය මගින් අන්තර්ජාතික සිවිල් හා දේශපාලනික අයිකිවාසිකම් පිලිබඳ සම්මුතිය යටතේ එන ඔප්ෂනල් ප්‍රොටෝකෝලය යටතේ පිහිටුවා ඇති මානව හිමි කම් කමිටුවට අභියාචනා කිරීමටත් යම් හෙයකින් එම කමිටුව මගින් රාමනායක මහතාට සාධනීය තීන්දුවක් ලැබේ නම් දැනට පවතින නීතිමය බාධක අභිබවමින් එවැනි නියෝගයක් මෙරට තුල ක්‍රියාත්මක කිරිරීමට දැනට රට තුල ක්‍රියාත්මක අන්තර්ජාතික සිවිල් හා දේශපාලනික අයිකිවාසිකම් පිලිබඳ සම්මුතිය පිලිබඳ පනත යටතේ ශ්‍රේෂ්ඨාධිකරණයට කරුනු කියා පැමටත් කටයුතු කරන බවත් දන්වා සිටිමු.